www.np.gov.lk

සිංහල පරිවර්තනය

**නිවේදන අංක: R/2025/07**

**පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි) III ශ්‍රේණිය හෝ පුහුණු කිරීමේ ශ්‍රේණිය යන තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025**

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්ගේ අංක CP/DEC/25 දරණ 2025.07.16 දිනැති ලිපිය මගින් යොමුකරන ලද 2025.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, උතුරු පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) ගේ අංක NP/02/01/RECRUITMENT/GENERAL දරණ 2025.07.18 දිනැති ඉල්ලීම් ලිපියට අනුව, උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක NP/01/02/07/01/01 අංක දරණ 2025.07.21 දිනැති ලිපියෙන් ලබාදුන් නිර්දේශයට අනුව, උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/NPC/A14/PPSC/Req/2025 දරණ 2025.08.06 දිනැති ලිපියෙන් ලද අනුමැතිය ප්‍රකාරව, උතුරු පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි) තනතුරට **උපලේඛනය - I** හි සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන විවෘත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2025 ඔක්තෝබර්** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.09.12** වේ.

- **උපලේඛනය - I**

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු අංකය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | කාර්මික නිලධාරි විදුලි (Electrical) **III ශ්‍රේණිය** | C | 02 |
| 02. | කාර්මික නිලධාරි විදුලි (Electrical) **පුහුණු කිරීමේ ශ්‍රේණිය** | D | |

## **02.** බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1 2013.06.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ 2016.07.12 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි) තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය යනාදිය මගින් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට සහ ඒවායේ කලින් කලට සිදුකෙරෙන සංශෝධනවලට, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ මෙම තනතුර හා සම්බන්ධ කලින් කලට නිකුත් කරනු ලබන නියමයන්, විධිවිධාන යනාදියට යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් **උපලේඛනය - I** හි සඳහන් පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි) තනතුරේ III ශ්‍රේණියට හෝ පුහුණු කිරීමේ ශ්‍රේණියට පත්කරනු ලැබේ.

02.2 විවෘත තරඟ විභාගය මගින් කාර්මික නිලධාරි (විදුලි) III ශ්‍රේණියට පත්කිරීමට තෝරාගන්නා අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. බඳවාගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි **පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි)** තනතුරේ **III ශ්‍රේණියට** පත් වූ දින සිට වසර තුනක් (03) ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

02.3 විවෘත තරඟ විභාගය මගින් පුහුණු කිරීමේ ශ්‍රේණියට පත්කිරීමට තෝරාගන්නා අයදුම්කරුවන් කාර්මික නිලධාරි (විදුලි) තනතුරේ පුහුණු කිරීමේ ශ්‍රේණියට පත්කරනු ලැබේ. මෙම අභ්‍යාසලාභීන් සඳහා නියමිත පුහුණු කාලය අවසානයේ දී සේවා ව්‍යවස්ථාවේ නියම කර ඇති පරිදි සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ විභාගයකට පෙනී සිටිය යුතුය. මෙම විභාගයෙන් සමත් වුවහොත් පමණක් මෙම තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.4 මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් "උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය" යන කොන්දේසියට යටත් විය යුතුය.

02.5 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අයදුම්කරුවෙකු, එකී සේවා ස්ථානයේම "අවම වශයෙන් **වසර 05 ක්** අඛණ්ඩව සේවය කළ යුතුය" යන්න අනිවාර්ය කොන්දේසියකි.

02.6 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

02.7 විවෘත තරඟ විභාගය මගින් බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ සම්පූර්ණ එකතුව **උපලේඛනය - I** හි සඳහන් පරිදි **දෙක (02) කි.** පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය

### 03.1 පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි) III වන ශ්‍රේණිය සඳහා:-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **10/2025** ප්‍රකාර **MN-3-2025** වැටුප් කේතය අනුව **පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි)** තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය රු.52,250 -10 X 800/= - 11 X 1,190/= - 10 X 1,320/= - 10 X1,350/= රු.100,040/= ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

### 03.2 පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි) පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා:-

පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි) තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ 2020.07.17 දිනැති සංශෝධන අංක - 01 හි නියම කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාරව, එම චක්‍රලේඛයේ **V වන උපලේඛනයෙ හි** පරිමාණයට සමාන වර්තමානයේ බලපැවැත්වෙන අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව, **VI වන උපලේඛනයෙ හි** නියම කර ඇති පරිදි පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා දීමනාව ලෙස රු.**41,317/-ක** මාසික දීමනාවක් 2025 වර්ෂයට අදාළව ගෙවනු ලැබේ.

## 04. සාමාන්‍ය සුදුසුකම්

04.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

04.2. අයදුම්කරු උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික, මානසික යෝග්‍යතාවයකින් යුතු විය යුතු අතර ම, මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

04.3. යම් ආගමක / ආගමික නිකායක පැවිදිවරයෙක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04.4. අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. අයදුම්කරු මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිරව පදිංචි වී සිටිය යුතු වේ.

**එසේ නැතහොත්**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය.

(*** සම්මුඛ පරීක්ෂණයේ දී** තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)

04.5. අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට හෝ ඊට පෙර සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

04.6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 18** ට නොඅඩු සහ වයස **අවුරුදු 30** ට නොවැඩි විය යුතුය.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

සෑම තනතුරකටම අදාළ අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් යනාදිය මෙම නිවේදනයේ **ඇමුණුම - I** හි දක්වා ඇත. අයදුම්කරන සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ සුදුසුකම් වලට වඩාත් ගැළපෙන තනතුරු නාමය සඳහා පමණක් අයදුම් කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## 06. බඳවා ගැනීමේ පරිපාටිය

06.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සියල්ල අයදුම්කරු විසින් සපුරා තිබිය යුතු අතර, ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සියල්ලම පෙර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06.2 ලිඛිත පරීක්ෂණය මගින් සහ කුසලතා පදනම මත බඳවා ගැනීමේ අවස්ථාවේ බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවාගැනීමේ පටිපාටිය, සේවා ව්‍යවස්ථාව, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව, කාර්මික නිලධාරි (විදුලි) තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීමේ සඳහන් කර ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සුදුසුකම් සහ සුදුසුකම් සනාථ කෙරෙන ලිපිලේඛන පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

06.3 ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව පත්වීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.4 **කෙසේ වුවද,** කාර්මික නිලධාරි (විදුලි) තනතුරේ **III ශ්‍රේණියට** සෘජුවම බඳවා ගැනීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන අවස්ථාවේ දී **ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පමණක් පුහුණු කිරීමේ ශ්‍රේණියට** බඳවා ගන්නා අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

06.5 සේවය සඳහා බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත සිදුකෙරෙනු ඇත. උතුරු පළාතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරඟ කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

(i) යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම් කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

(ii) පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කරගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙළින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

06.6 ඉහත සඳහන් ආකාරයට බඳවා ගැනීම සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන්ගෙන් විශේෂ අවශ්‍යතා සහිතවූවන් (ආබාධ සහිත පුද්ගලයින්) සඳහා වෙන් වූ ප්‍රතිශතය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 ප්‍රකාරව සලකා බලනු ලැබේ. අපේක්ෂකයෙකු පත්වීමක් සඳහා තෝරාගැනීමේ දී අදාළ තනතුරේ රාජකාරි ඉටුකිරීමට තම ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතුය.

<u>සටහන</u>

අයදුම්කරු ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන පුනරුත්ථාපන තත්ත්වය යටතේ නියමිත පරිදි අයදුම් කරන බවට අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර, ආබාධිත පුද්ගලයෙකු නොවන අයදුම්කරුවෙකු තමා ආබාධිත පුද්ගලයෙකු බවට සඳහන් නොකළ යුතුයි.

## 07. විභාග ගාස්තුව

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස රු.500/= මුදලක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ලැබෙන පරිදි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ගෙවා, අදාළ ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කිරීමේ පිළිවෙල

08.1 මෙම නිවේදනය සමග අමුණා ඇති අයදුම්පත [www.np.gov.lk](http://www.np.gov.lk) උතුරු පළාත් නිල වෙබ් අඩවියට පිවිස බාගත කරගෙන සම්පූර්ණ කළ අයදුම්පත, **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

08.2 අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/193"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

08.4 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

08.5 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපැල - **examppscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## 09. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

09.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමන හෝ එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය. එම රෙගුලාසි උල්ලංඝණය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

09.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 11. අත්සන සහතික කිරීම

**සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ.** අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ස්ථිර රාජ්‍ය හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

## 12. විභාග පරිපාටිය

**පළාත් තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි - විදුලි (Electrical) III ශ්‍රේණියට හෝ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම**

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් **ප්‍රශ්න පත්‍ර 02 න්** සමන්විත වන අතර, මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම ලිඛිත පරීක්ෂණයට පෙනී සිට ඉන් සමත් නොවූ කිසිදු අයදුම්කරුවෙකුට ප්‍රතිඵල නැවත පරීක්ෂා කිරීම වෙනුවෙන් අයදුම් කිරීමේ හැකියාවක් නොමැත.

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ. | පැය 01 යි | 100 |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ විද්‍යුත් පරිපථ, (Electric Circuits), විද්‍යුත් නියමවිධි (Electoral Regulations), පිඹුරුපත් පිළිබඳ දැනුම (Knowledge of Plans), ඇස්තමේන්තු සකස් කිරීම සහ පරිපථ පරීක්ෂා කිරීම ( Preparation of estimates and testing of circuits) පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ. | පැය 03 යි | 100 |

<u>සටහන</u>

මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට නම් ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක්වත් **40%** අපේක්ෂකයින් විසින් ලබාගත යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් අයදුම්කරුවන් ලබාගත් වැඩිම මුළු ලකුණුවල එකතුවේ අනුපිළිවෙල (Merit Order) සළකා බලනු ලැබේ.

## 13. විභාග ප්‍රතිඵල

අයදුම්කරුවන්ගේ සම්පූර්ණ විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

**සැළකිය යුතුය:-**

(i). මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ii). මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

(iii). මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

(iv). මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

(v). මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2025.08.19**

| අනු අංකය | තනතුරු නාමය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| 01 | කාර්මික නිලධාරි (විදුලි) III ශ්‍රේණිය | (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් **එක් වරක දී** භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), ගණිතය සහ විද්‍යාව යන විෂයයන් ඇතුළත්ව විෂයයන් හතරක (04) ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.<br><br>සහ<br><br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ගණිත විෂයය ධාරාවෙන් ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය සමග භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළත්ව විෂයය ධාරාවට අයත් විෂයයන් **තුන (03) කින් එක් වරක දී** සමත්ව තිබිය යුතුය. | (i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (විදුලි) සහතිකය;<br><br>හෝ<br><br>(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා (විදුලි) සහතිකය;<br><br>හෝ<br><br>(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමා (විදුලි) සහතිකය;<br><br>හෝ<br><br>(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමා (විදුලි) සහතිකය;<br><br>(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම;<br><br>හෝ<br><br>(vi) කාර්මික නිලධාරි (විදුලි) ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;<br><br>හෝ<br><br>(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

| අනු අංකය | තනතුරු නාමය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| 02 | කාර්මික නිලධාරි (විදුලි) පුහුණු කිරීමේ ශ්‍රේණිය (පුහුණු කාලය වසර 01 කි.) | (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් **එක් වරක දී** භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), ගණිතය සහ විද්‍යාව යන විෂයයන් ඇතුළත්ව විෂයයන් හතරක (04) ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.<br><br>සහ<br><br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ගණිත විෂයය ධාරාවෙන් ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය සමග භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළත්ව විෂයය ධාරාවට අයත් **විෂයයන් තුන (03) කින් එක් වරක දී** සමත්ව තිබිය යුතුය. | (i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව (NCT) (විදුලි) සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>හෝ<br><br>(ii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරන තනතුරට ගැළපෙන පාඨමාලාවක් හදාරා ජාතික සහතිකපත්‍ර පාඨමාලාව (NCC) (විදුලි) සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම<br><br>හෝ<br><br>(iii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

**සටහන:-**

01. විවෘත තරඟ විභාගය මගින් **පුහුණු කිරීමේ ශ්‍රේණියට (විදුලි)** බඳවා ගත් අයදුම්කරුවන්, බඳවා ගැනීමේ පරිපාටිය සහ සේවා ව්‍යවස්ථා සංග්‍රහය යනාදියෙහි සඳහන් ප්‍රතිපාදන අනුව, පුහුණු කාලය සාර්ථකව අවසන් කර ඉන් පසුව පැවැත්වෙන විභාගයෙන් සමත් වූ බවට අදාළ ආයතනය විසින් ලබාදෙන ප්‍රතිඵල ඉදිරිපත් කිරීමෙන් පසුව **III ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ.

02. එම පුහුණු කාලසීමාව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුන්ට **මාස 06 කට** නොවැඩි කාලයක් සඳහා පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගයෙන් අසමත්වන, විවෘත තරඟ විභාගය මගින් බඳවාගත් ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.